# සන්නිවේදනය හා මධ්‍ය අධ්‍යයනය - 13 ශ්‍රේණිය

## 09 පාඩම - සංවර්ධනය සඳහා සන්නිවේදනය

1. සංවර්ධනය යනු කුමක්ද?
2. සංවර්ධනය යන සංකල්පය ගොඩනැගුණේ කුමන කාලයක, කුමන හේතුවක් මුල්කර ගනිමින් ද?
3. i. 1990 දශකය තෙක් සංවර්ධන සංකල්පය මත පදනම් වෙමින් ලෝක සමාජය වර්ගකර තිබුණේ කෙසේද?
   ii. එම වර්ගීකරණයට අනුව ඊට අදාළ එක් එක් රටවල් කාණ්ඩයේ ආර්ථිකයේ දැකිය හැකි වූ ප්‍රධාන ලක්ෂණය කුමක් ද?
4. සංවර්ධන සන්නිවේදනය යන්නෙන් මූලික වශයෙන් අදහස් වන්නේ කුමක් ද?
5. රටක ජාතික සංවර්ධනය යන්නට අයත් වන ප්‍රධාන අංශ හතර නම් කරන්න. ඉන් වඩාත් වැදගත් වන්නේ කුමන අංශයක සංවර්ධනය ද?
6. තුන්වන ලෝකයෙහි ජාතික සංවර්ධනයේ ඇති වැදගත්කම පළමුවරට හඳුනාගන්නා ලද්දේ කවුරුන් විසින් ද? ඔහුට අනුව සංවර්ධන සන්නිවේදනට අයත් ක්‍රියාවන් හතරක් නම් කරන්න.
7. රටක් සංවර්ධනය කිරීමෙහි ලා බටහිර විද්‍යාඥයන් විසින් පිළිගත් ඉහළ සිට පහළට වූ ධූරාවලිය පසුකාලීනව දැඩි ලෙස විවේචනයට ලක්වූයේ ඇයි?
8. **'සංවර්ධන සන්නිවේදනය'** යන සංකල්පය **'සංවර්ධනය සඳහා සන්නිවේදනය'** යනුවෙන් වෙනස් වද්දී එහි මූලික තේමාව වූයේ කුමක්ද?
9. සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති නිර්වචනය ලියා දක්වන්න.
10. සංවර්ධනය සඳහා සන්නිවේදනය පිළිබඳ සිල්වියෝ වයිස් බෝඩ් හෝ ශ්‍රීනිවාස් මෙල්කොට් යන දෙදෙනාගෙන් එක් අයෙකු විසින් ඉදිරිපත් කර ඇති අදහස් දක්වා ඉන් දෙකක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
11. සංවර්ධනය සඳහා සන්නිවේදනයේ නව ප්‍රවණතාවක් ලෙස සංවර්ධන කාර්යයේ දී යොදාගත හැකි නව මෙවලම් හා උපක්‍රම මොනවාදැ යි නම් කරන්න.
12. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති සංවර්ධනය සඳහා සන්නිවේදනයේ නව ප්‍රවේශ හතර සඳහන් කරන්න.
13. i.සංවර්ධනය සඳහා සන්නිවේදනය සංකල්පයේ දී භාවිතයට ගැනෙන **'ප්‍රාදේශීයකරණය'** යන්න හඳුන්වන්න.

Hewavitharana M.V.

ii. එහිදී සංවර්ධනයට අදාළව ග්‍රාමීය ප්‍රජාවගේ සහභාගීත්වය ලබාගත හැකි කාර්යයන් නම් කරන්න.

14. සංවර්ධනය සඳහා සන්නිවේදනය සංකල්පයේ දී **'ජනතා කේන්ද්‍රීයතාව'** යනුවෙන් කුමක් අදහස් වේද?

15. සංවර්ධනය සඳහා සන්නිවේදන සංකල්පයේ දී **'සමානාත්මතාව'** ඇති කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග හතරක් නම් කරන්න.

16. සංවර්ධන කාර්යයේ දී වර්තමාන ලෝකය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වූ **දරිද්‍රතාවය** පිටුදැකීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හතරක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න.

17. සංවර්ධනය සඳහා සන්නිවේදනයේ දී ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජනතා මැදිහත්වීම වැදගත් වන්නේ ඇයි? කෙටියෙන් පැහැදිලි කරන්න.

18. සංවර්ධනයේ දී සන්නිවේදන අවශ්‍යතා යනුවෙන් හැඳින්වෙන්නේ මොනවාද? ඊට අයත් කරුණු පහක් ලියන්න.

19. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය සංවර්ධනය සඳහා සන්නිවේදනයේ දී අංශ තුනක් කෙරෙහි අවධානය යොමු කරයි. එම අංශ තුන නම් කරන්න.

20. සංවර්ධනයේ තවත් පැතිකඩක් වන **'අත්‍යවශ්‍ය මානුෂීය තොරතුරු සම්පාදනය'** වර්තමාන මාධ්‍ය ඔස්සේ ක්‍රියාවට නැංවෙමින් පවතින ආකාරය විමර්ශනය කරන්න. (අත්‍යවශ්‍ය මානුෂීය තොරතුරු - ආහාර, වාතය, ජලය, ලිංගිකත්වය, ආරක්ෂාව, අනන්‍යතාව පිළිබඳ හැඟීම, සංස්කෘතික උරුමය, ..............)

21. සංවර්ධනය සඳහා සන්නිවේදන ව්‍යාපෘතියක් සකස් කිරීමේ පියවර පහ නම් කරන්න.

22. සංවර්ධන පණිවුඩ ජනතාවට සන්නිවේදනය කිරීමට සුදුසු **සන්නිවේදන වර්ග** උදාහරණ සහිතව විස්තර කරන්න.

23. කොවිඩ් 19 වසංගතය හමුවේ රජය, ජනමාධ්‍ය ඇතුළු විවිධ පාර්ශව කෘෂිකර්මාන්තය නගා සිටුවීමේ අරමුණින් වගා සංග්‍රාමයක් ආරම්භ කර ඇත. මේ සඳහා සංවර්ධන සන්නිවේදනය යොදාගත හැක්කේ කෙසේද? පැහැදිලි කරන්න.

24. ඔබ ප්‍රදේශයේ දැකිය හැකි සංවර්ධන ගැටලු පහක් නම් කරන්න. ඉන් එකක් තෝරාගෙන එම ගැටලුව විසඳීම සඳහා සංවර්ධනය සඳහා සන්නිවේදනය භාවිත කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

25. ග්‍රාමීය ප්‍රදේශ වෙත සංවර්ධන පණිවිඩ සන්නිවේදනය සඳහා යොදාගත හැකි එක් ක්‍රමවේදයක් වන්නේ ප්‍රජා සහ ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවන් ය. ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද ප්‍රජා සහ ප්‍රාදේශීය ගුවන්විදුලි සේවාවන් මොනවාද?

***"වෙහෙසීමට නොහැකි නම් සෑම සිහිනයක්ම සිහිනයක් පමණි."***

Hewavitharana M.V.